**ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය, කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

# රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව (SD&CC)

# පුරප්පාඩු

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) හි/ (සීඩාහි) CS1 ශ්‍රේණියෙහි ලියාපදිංචිය සහ ISO 90001:2015 සහතිකය සහිත, රජයේ ආයතනයක/ සංවිධානයක, බර (Heavy) සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ වෘත්තියවේදීන් කණ්ඩායමක් හා එක්වීම සඳහා වෘත්තීය රැකියා අවස්ථා පිරිනමනු ලැබීමට සුදුස්සන් වෙත මෙසේ ආරාධනය කෙරේ.

පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙතින්, අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

## 01. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කාර්ය සාධන අධීක්ෂණ ඒකකය) 1A ශ්‍රේණිය (HM 1-2)

**සුදුසුකම් :**

* පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සිවිල් ඉංජිනේරු උපාධියට හෝ සමාන සුදුසුකම් සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) හි හෝ පිළිගත් වෘත්තියවේදී ඉංජිනේරු ආයතනයක ආයතනික සාමාජිකත්වය

සමග

* අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05) ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද
* ඉදිකිරීම් ආයතනයක/ සංවිධානයක පළපුරුද්ද සහිත අය හට ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

**වැටුප් පරිමාණය :** HM 1-2 80,295-15X2270-114,345/-

**වයස් සීමාව** : වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

## 02. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉදිකිරීම්) 1A ශ්‍රේණිය (HM 1-2)

**සුදුසුකම් :**

* පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සිවිල් ඉංජිනේරු උපාධිය හෝ සමාන සුදුසුකම් සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) හෝ පිළිගත් වෘත්තියවේදී ඉංජිනේරු ආයතනයක ආයතනික සාමාජිකත්වය

සමග

* අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05) ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද
* ඉංජිනේරු ආයතනයක පළපුරුද්ද සහිත අය හට ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

**වැටුප් පරිමාණය :** HM 1-2 80,295-15X2270-114,345/-

**වයස් සීමාව** : වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

## 03. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (යාන්ත්‍රික) 1A ශ්‍රේණිය (HM 1-2)

**සුදුසුකම් :**

* පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් යාන්ත්‍රික ඉංජිනේරු උපාධියක් හෝ සමාන සුදුසුකමක් සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) හි හෝ පිළිගත් වෘත්තියවේදී ඉංජිනේරු ආයතනයක ආයතනික (Corporate) සාමාජිකත්වය ලබා තිබීම.

සමග

* අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05) ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද

සහ

* බර ඉංජිනේරු යන්ත්‍ර, යන්ත්‍රාගාර සහ යන්ත්‍ර සූත්‍ර පිළිබඳ කටයුතුවල නියැළි, විශාල පරිමාණයේ වැඩහලක (Workshop) කළමනාකරු ලෙස සහ ඉදිකිරීම් ආයතනයක කටයුතුවල පළපුරුද්දක් ඇති අයවළුන් හට ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

**වැටුප් පරිමාණය :** HM 1-2 80,295-15X2270-114,345/-

**වයස් සීමාව** : වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

## 04. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) 1A ශ්‍රේණිය (HM 1-2)

**සුදුසුකම් :**

* ICASL (ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය) ACCA (සහතිකලත් වරලත් ගණකාධිකාරී සංගමය), CIMA (වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය) වැනි වෘත්තියවේදී ආයතනයක පූර්ණ සාමාජිකත්වය හෝ සමාන සුදුසුකම්

සමග

මූල්‍ය කටයුතු පිළිබඳ වසර 08 ක සමස්ත පළපුරුද්ද, ඉන් වසර 05 ක්,පශ්චාත් යෝග්‍යතා පළපුරුද්දක් විය යුතුය. ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකු ලෙස කටයුතු කිරීමෙහිලාලත් පළපුරුද්දක් විය යුතු වන අතර, කළමනාකරණ ගිණුම්කරණ පද්ධති පිළිබඳ මනා දක්ෂතාවයක්ද තිබිය යුතුය.

**වැටුප් පරිමාණය :** HM 1-2 80,295-15X2270-114,345/-

**වයස් සීමාව** : වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

## 05. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නිර්මාණ සැලසුම් හා නිෂ්පාදන) 1A ශ්‍රේණිය (HM 1-2)

**සුදුසුකම් :**

* පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සිවිල් ඉංජිනේරු උපාධිය හෝ සමාන සුදුසුකමක් සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) හි හෝ පිළිගත් වෘත්තියවේදී ඉංජිනේරු ආයතනයක ආයතනික (Corporate) සුදුසුකම්

සමග

* අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05) ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද
* පිළිගත් ඉදිකිරීම් ආයතනයක (විශේෂයෙන් සැලසුම්කරණ හා නිර්මාණමය කටයුතු වල, සුවිශේෂීව) පළපුරුද්දක් සහිත අයවළුන් හට ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

**වැටුප් පරිමාණය :** HM 1-2 80,295-15X2270-114,345/-

**වයස් සීමාව** : වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

## 06. ඉදිකිරීම් ආරක්ෂණ හා වෘත්තීය සෞඛ්‍ය කළමනාකරු (CONSTRUCTION SAFETY & OCCUPATIONAL HEALTH MANAGER) (MM 1-2) (කොන්ත්‍රාත් පදනම මත)

**සුදුසුකම් :**

* පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු උපාධිය හෝ විශේෂ උපාධියක් (වසර 4 ක කාලයක් තුළලත්)

සමග

* CIDA (සීඩා) ආයතනය විසින් පිළිගනු ලබන/පවත්වාගෙන ගිය ඉදිකිරීම් ආරක්ෂණ හා වෘත්තීයමය සෞඛ්‍ය (CSOH) පිළිබඳ ඩිප්ලෝමාවක්

**වැටුප් පරිමාණය :** MM 1-2 54,550 - 10X1,375-15X1,910-96,950/-

**වයස් සීමාව** : වයස අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.

## 07. ඉදිකිරීම් ආරක්ෂණ හා වෘත්තීයමය සෞඛ්‍ය නිලධාරී (CONSTRUCTION SAFETY & OCCUPATIONAL HEALTH OFFICER (JM 1-1) (කොන්ත්‍රාත් පදනම මත)

**සුදුසුකම් :**

* ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) හෝ ජාතික තාක්ෂණ සහතිකය (NCT) සමග අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05) ක පළපුරුද්ද.

සමග

* CIDA (ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය - සීඩා) විසින් පවත්වනු ලබන/ පිළිගනු ලබන CSOH (ඉදිකිරීම් ආරක්ෂණ හා වෘත්තීයික සෞඛ්‍ය) පිළිබඳ ඩිප්ලෝමාව.

**වැටුප් පරිමාණය :** JM 1-1 42,600-10X755-18X1,135 - 70,580/-

**වයස් සීමාව** : වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරාගනු ලබන අපේක්ෂකයා හට පහත සඳහන් දෑ ඇතුළුව ආකර්ෂණීය වැටුප් හා ප්‍රතිලාභ රැසක් පිරිනැමෙනු ඇත.**

- රජය අනුමත දීමනා
- වාර්ෂික ප්‍රසාද දීමනා
- උපයෝගී කොට නොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්
- වෛද්‍ය රක්ෂණ ආවරණය
- දිරි දීමනා
- වෘත්තිය දීමනා
- දෙනු ලබන රථවාහන/ ප්‍රවාහන දීමනා
  (මෙය HM මට්ටමේ තනතුරු සඳහා පමණි)

* අභ්‍යන්තර අපේක්ෂකයින් හට වයස් සීමාවන් අදාළ නොවනු ඇත.

සුදුසුකම් පිළිබඳ සම්පූර්ණ තොරතුරු විස්තර සහිත අයදුම්පත්, අදාළ සහතිකවල පිටපත් සමග, ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනද සහ විමසුම් අංකද සමග මෙම දැන්වීමේ දින සිට දින 14 ක් ඇතුළත ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන) වෙත ලැබෙන සේ යොමු කළ යුතුය. අයදුම් කරන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අපේක්ෂකයින් විසින් පැහැදිලිව සටහන් කළ යුතුය.

**සභාපති,**
**රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව (SD & CC)**
**අංක 07, බොරුපන පාර,**
**රත්මලාන.**

SLSI SYSTEM CERTIFIED ISO 9001

MGMT. SYS. RvA C 155

**"යටිතල පහසුකම් ඉදිකිරීම් පිළිබඳ පුරෝගාමියෝ"**

Source: Dinamina, Daily News (2020.10.14)